අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/16/02/08/01/2025 ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2025.10. 16

**චක්‍රලේඛ අංකය : 29/2024 (I)**

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පරිවේණාධිපතිවරුන්
සියලු ම රජයේ පාසල්වල විදුහල්පතිවරුන්
සියලු ම රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්
සියලු ම උපකෘත විශේෂ පාසල්වල විදුහල්පතිවරුන්

**සුරක්ෂා සිසු රක්ෂණාවරණය**

"සුරක්ෂා සිසු රක්ෂණාවරණය" යන මැයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද 2024.08.02 දිනැති අංක 29/2024 දරන චක්‍රලේඛයේ පහත සඳහන් වගන්ති සංශෝධනය වන අතර එහි සඳහන් අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

02. **චක්‍රලේඛයේ 05 වගන්තිය** - "මෙම රක්ෂණාවරණය යටතේ දෙමාපිය මරණ ප්‍රතිලාභය හිමිවනුයේ වාර්ෂික ආදායම රු.180,000/= කට වඩා අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන් සහ 'අස්වැසුම' වැඩසටහනට අයත් පවුල්වල සිසුන් සඳහා පමණි" යන්න පහත පරිදි සංශෝධනය වේ. මෙය උපදෙස් මාලාවෙහිද සෑම ස්ථානයකම පහත පරිදි සංශෝධනය වේ.

   i. **මෙම රක්ෂණාවරණය යටතේ දෙමාපිය මරණ ප්‍රතිලාභය හිමිවනුයේ වාර්ෂික ආදායම රු.240,000/= කට වඩා අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන් සහ 'අස්වැසුම' වැඩසටහනට අයත් පවුල්වල සිසුන් සඳහා පමණි.**

03. **චක්‍රලේඛයේ 06 වගන්තිය** - '2024 ජූලි 01 දින සිට 2027 ජූනි 30 දින දක්වා වසර 03ක කාලයක්' යන්න **2024 ජූලි 01 දින සිට 2027 අගෝස්තු 31 දින දක්වා වසර 03ක කාලයක්** ලෙස සංශෝධනය වේ. එසේම මෙම කාල සීමාව උපදෙස් මාලාවෙහිද සෑම ස්ථානයකම ඉහත පරිදි සංශෝධනය වේ.

04. උපදෙස් මාලාවේ, 2 වන පරිච්ඡේ[illegible]ෂණාවරණ ප්‍රතිලාභ පහත පරිදි සංශෝධනය වේ.

   i. චක්‍රලේඛයේ 2.1.1හි වගන්ති 2.1.1.4 සහ 2.1.1.3 ,2.1.1.2 ,2.1.1.1නොවෙනස්ව පවතින අතර 2.1.1.4 වගන්තියට " b සහ c " ලෙස පහත නව කරුණු එක් කෙරේ.

      **b** - කොඳුඇට පෙළ විකෘතිවීම නිවැරදි කිරීමේ සඳහා පළඳින උපාංගය (Scoliosis Brace) සඳහා වන වියදම

      **c** - කර්ණශංඛ උපකරණ සඳහා වන වියදම (උගුර, කන, නාසය පිළිබඳ ශල්‍ය වෛද්‍යවරයකු විසින් නිර්දේශිත)

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

ii. චක්‍රලේඛයේ 2.1.2 හි " a, b, c සහ d " නොවෙනස්ව පවතින අතර " e සහ f " පහත පරිදි සංශෝධනය වේ. එසේම " g " ලෙස නව කරුණක් එකතු කෙරේ.

e - ඇස ආශ්‍රිත ආබාධ (visual aids) නිවැරදි කිරීමේ උපාංග සඳහා (මෙය ප්‍රතිපූරණය කිරීමේ පදනම මත ලබා ගත හැකි ප්‍රතිලාභයකි. එසේ වුවද අඩු ආදායම්ලාභීන් සඳහා මෙම පහසුකම සෘජු ගෙවීමේ ක්‍රමය යටතේ ලබා ගත හැකිය - ඇස් කණ්ණාඩි සඳහා උපරිම වියදම වසරකට රු. 10,000/= )

f - හදිසි අනතුරක දී හෝ හදිසි අනතුරක් නොවන අසනීප අවස්ථාවක දී හෝ ප්‍රතිකාර සඳහා අවශ්‍ය වන Lumber Guards and cervical collars උපාංග සඳහා (විශේෂඥ වෛද්‍යවරයකු විසින් නිර්දේශිත)

g - අසාධ්‍ය රෝග කාණ්ඩයට අයත් රෝග සහ පහත සඳහන් රෝග සඳහා දීර්ඝකාලීනව ඖෂධ ලබා ගැනීම සඳහා වන වියදම (මෙම රෝග සඳහා සුදුසුකම්ලත් MBBS වෛද්‍යවරයකු විසින් නිර්දේශිත වෛද්‍ය වට්ටෝරු සඳහා)

i. Epilepsy
ii. Nephrotic syndrome
iii. Rheumatoid arthritis
iv. Systemic lupus erythematosis
v. Ulcreative colitis
vi. Crohn disease
vii. Rheumatic valvular heart disease

iii. චක්‍රලේඛයේ 2.1.3 හි 2.1.3.1 වගන්තියේ " n සහ o " පහත පරිදි සංශෝධනය කරන අතර " p " ලෙස නව රෝගයක් අලුතින් එක් කෙරේ.

n - Thalassemia, hereditary spherocytosis, sickle cell anemia
o - Encephalitis
p - Pneumothorax

05. උපදෙස් මාලාවේ 3 පරිච්ඡේදයේ 3.3 සහ 3.5 වගන්ති පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

i **3.3 - ප්‍රතිලාභ ලැබීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන**

ප්‍රතිලාභ ලැබීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන පිළිබඳ තොරතුරු පහත වගුවෙහි දැක්වේ. එම ලිපි ලේඛන, විදුහල්පති හෝ විදුහල්පති විසින් සුරක්ෂා සිසු රක්ෂණාවරණය විෂය සඳහා බලය පවරන ලද නිලධාරියා විසින් හෝ අත්සන, දිනය හා නිල මුද්‍රාව තබා සහතික කර දින 90ක් ඇතුළත (රෝහල් ගත වූ දින සිට / මරණය සිදු වූ දින සිට) ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ආයතනයේ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයක් වෙත භාර දිය යුතු වේ (දෙමාපිය/ විදුහල්පති/ පරිවේනාධිපති විසින්).

ii **3.5 - ලිපි ලේඛන භාර දීම**

හිමිකම්ලාභියා විසින් හිමිකම් ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අදාළ සියලුම ලිපි ලේඛන සහතික කිරීම සඳහා පාසලේ විදුහල්පති වෙත ලබා දිය යුතු වේ. විදුහල්පති විසින් එම ලිපි ලේඛනවල සඳහන් තොරතුරු අපැහැදිලි නොවන සේ සහතික කර නිල මුද්‍රාව තැබිය යුතුය.

සහතික කරන ලද ලිපි ලේඛන ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ආයතනයේ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයක් වෙත ලබා දීම සඳහා දෙමාපියන් වෙත ලබා දීම හෝ විදුහල්පති/ පරිවේනාධිපති විසින් ආයතනය වෙත භාර දීම හෝ සිදු කළ යුතු වේ. පාසල වෙත ඉදිරිපත් වන සියලුම අයදුම්පත්වලට අදාළ තොරතුරු ඇමුණුම 06 මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතු වේ.

06. උපදෙස් මාලාවේ 4 පරිච්ඡේදයේ 4.2, 4.3, සහ 4.4 වගන්ති පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

- 4.2 හි "a, b, c" නොවෙනස්ව පවතින අතර "d" සඳහන් කාල සීමාව පමණක් පහත පරිදි සංශෝධනය වේ.

  - 2024.07.01 සිට 2024.12.31 තෙක් 2025.03.15 ට පෙර හා
  - 2025.01.01 සිට 2025.08.31 තෙක් 2025.11.30 ට පෙර

  2025/2026 වර්ෂය සඳහා
  - 2025.09.01 සිට 2026.02.28 තෙක් 2026.05.15 ට පෙර හා
  - 2026.03.01 සිට 2026.08.31 තෙක් 2026.11.15 ට පෙර

  (ඉහත ආකාරයට 2026/2027 වර්ෂය සඳහා ද ලබා දිය යුතු වේ.)

- 4.3 හි "a, b, c" නොවෙනස්ව පවතින අතර "d" ඉවත් කෙරේ " .e " හි සඳහන් කාල සීමාව පමණක් පහත පරිදි සංශෝධනය වේ.

  - 2024.07.01 සිට 2024.12.31 තෙක් 2025.03.01 ට පෙර හා
  - 2025.01.01 සිට 2025.08.31 තෙක් 2025.11.01 ට පෙර

  2025/2026 වර්ෂය සඳහා
  - 2025.09.01 සිට 2026.02.28 තෙක් 2026.05.01 ට පෙර හා
  - 2026.03.01 සිට 2026.08.31 තෙක් 2026.11.01 ට පෙර

  (ඉහත ආකාරයට 2026/2027 වර්ෂය සඳහා ද ලබා දිය යුතු වේ.)

- 4.4 හි "a, b, c, e, g" නොවෙනස්ව පවතින අතර "d සහ f" ඉවත් කෙරේ " .h " හි සඳහන් කාල සීමාව පමණක් පහත පරිදි සංශෝධනය වේ.

  - 2024.07.01 සිට 2024.12.31 තෙක් 2025.02.01 ට පෙර හා
  - 2025.01.01 සිට 2025.08.31 තෙක් 2025.10.01 ට පෙර

  2025/2026 වර්ෂය සඳහා
  - 2025.09.01 සිට 2026.02.28 තෙක් 2026.04.01 ට පෙර හා
  - 2026.03.01 සිට 2026.08.31 තෙක් 2026.10.01 ට පෙර

  (ඉහත ආකාරයට 2026/2027 වර්ෂය සඳහා ද ලබා දිය යුතු වේ.)

07. උපදෙස් මාලාවේ 5 පරිච්ඡේදයේ 5.3 හි " b, d, e, සහ f " නොවෙනස්ව පවතින අතර " a සහ c" පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

a. ප්‍රතිලාභ ලැබීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන, විදුහල්පති හෝ විදුහල්පති විසින් සුරක්ෂා සිසු රක්ෂණාවරණය විෂය සඳහා බලය පවරන ලද නිලධාරියා හෝ විසින් අත්සන, දිනය හා නිල මුද්‍රාව තබා සහතික කර දින 90ක් ඇතුළත ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ජෙනරල් ලිමිටඩ් ආයතනයේ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයක් වෙත භාර දීම සිදු කළ යුතුවේ.

c. ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබන්නේ හිමිකම්පත හා ලිපි ලේඛනවල මුල් පිටපත් හෝ එම ලිපි ලේඛන ඉල්ලා ඇති ආකාරයට හෝ භාර දී ඇත්නම් පමණි.

සුරක්ෂා සිසු රක්ෂණාවරණය වැඩසටහන 2025.09.01 දින සිට ඉදිරියට ක්‍රියාත්මක කිරීමේ දී ඉහත සංශෝධන අනුව කටයුතු කළ යුතු බව දන්වමි.

නාලක කලුවැව
ලේකම්